2018

# කාර්ය සාධන වාර්තාව

ජාතික අයවැය දෙපාර්තමේන්තුව

# පටුන



| පරිච්ඡේද අංකය | | විෂයය | පිටුව |
|---|---|---|---|
| **01.** | | **සමාලෝචනය** | 01 |
| | 1.1 | දැක්ම | 01 |
| | 1.2 | මෙහෙවර | 01 |
| | 1.3 | අරමුණු | 01 |
| | 1.4 | කාර්යයන් සහ වගකීම් | 02 |
| | 1.4.1 | ජාතික අයවැය සකස් කිරීම | 02 |
| | 1.4.2 | 2018 වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම | 03 |
| | 1.4.3 | අත්තිකාරම් ගිණුම් කටයුතු | 03 |
| | 1.4.4 | අයවැය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම | 04 |
| | 1.4.5 | විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම | 04 |
| | 1.4.6 | කාර්ය සාධන සාරාංශය | 04 |
| | | | |
| **02.** | | **2018 අයවැය විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම** | 08 |
| | 2.1 | 2018 සඳහා විසර්ජන පනත | 08 |
| | 2.2 | පරිපූරක ඇස්තමේන්තු | 08 |
| | 2.3 | පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර | 09 |
| | 2.4 | 2018 අයවැයෙහි කාර්ය සාධනය | 10 |
| | 2.5 | අත්තිකාරම් ගිණුම් කටයුතු | 15 |
| | 2.6 | 2018 අයවැය කළමනාකරණය | 15 |
| | 2.6.1 | අරමුදල් මාරු කිරීම | 15 |
| | 2.6.2 | පරිපූරක සහාය සේවා සහ හදිසි අවස්ථා වගකීම් | 15 |
| | 2.6.3 | අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම | 16 |
| | | | |
| **03.** | | **2018 සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම** | 16 |
| | 3.1 | අයවැය සකස් කිරීමේ මාර්ගෝපදේශ | 17 |

| | | | |
|---|---|---|---|
| **04.** | | **විශේෂ ක්‍රියාකාරකම්** | 17 |
| | 4.1 | රාජ්‍ය ආයතනවල අයවැය කළමනාකරණය | 17 |
| | 4.2 | අමාත්‍ය මණ්ඩල සංදේශ | 18 |
| | 4.3 | මණ්ඩල හා කමිටු සඳහා කාර්ය මණ්ඩලය සහභාගී වීම | 18 |
| | | | |
| **05.** | | **ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්ය භාරය** | 19 |
| | 5.1 | කාර්ය මණ්ඩලය | 19 |
| | 5.2 | මානව සම්පත් සංවර්ධනය | 21 |
| | 5.2.1 | විදේශ පුහුණු / සම්මන්ත්‍රණ / රැස්වීම් | 21 |
| | 5.2.2 | දේශීය පුහුණු | 23 |
| | 5.3 | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය | 25 |
| | 5.3.1 | 2018 වර්ෂය සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | 26 |
| | 5.3.2 | 2018 සඳහා විගණකාධිපතිගේ විමසුම් | 27 |
| | 5.4 | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 28 |

# 1. සමාලෝචනය

පාර්ලිමේන්තු පනත්හි ප්‍රතිපාදන යටතේ පිහිටුවන ලද නෛතික රාමුවක් තුළ සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. සමස්ත මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍යකාලීන වියදම් රාමුවක් මත පදනම්ව අයවැය සකස් කිරීමේ කේන්ද්‍රීය ස්ථානය ලෙස දෙපාර්තමේන්තුව කටයුතු කරයි. රාජ්‍ය වියදම් කළමනාකරණය කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කරමින් ආංශීය ප්‍රතිපත්ති උපාය මාර්ග සන්දර්භය තුළ විශේෂිත ඉලක්ක වෙත මධ්‍යකාලීන වියදම් රාමුව එහි මූල්‍ය සැළසුම් ඉදිරිපත් කරනු ලැබේ. රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග නිරන්තර තොරතුරු විමසීම්හි මෙම ක්‍රියාවලිය නිරත වේ.

## 1.1 දැක්ම

"රාජ්‍ය සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදනය හා කළමනාකරණය තුලින් සමාජ - ආර්ථික සංවර්ධනය."

## 1.2 මෙහෙවර

රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනිමින් රාජ්‍ය භාණ්ඩ සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදා හැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීම.

## 1.3 අරමුණු

- මූල්‍ය විනය පවත්වා ගැනීම
- මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- වඩාත් ඵලදායී අයුරින් වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අධ්‍යයනයන් සිදු කිරීම හා දැනුම බෙදා ගැනීම.

## 1.4 කාර්යයන් සහ වගකීම්

### 1.4.1 ජාතික අයවැය සකස් කිරීම

- අයවැය ක්‍රියාවලිය සැලසුම් කිරීම පිළිබඳව භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා පැවැත්වීම
- අයවැය සඳහා වූ සාර්ව ආර්ථික රාමුව සැකසීම
- අයවැය සඳහා වූ සාර්ව ආර්ථික රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීම/අයවැය ලිපි ඉදිරිපත් කිරිම
- වියදම් ඒකක හා සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක, ආදායම් දෙපාර්තමේන්තු හා පෞද්ගලික අංශය සමග අයවැය සාකච්ඡා මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කර ආදායම, වියදම, මූල්‍යකරණ හා ණය ගැනීම් සීමාවන් (දේශීය හා විදේශීය) නිගමනය කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් සම්පාදකගේ හා නීතිපතිගේ අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පලකිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් මුද්‍රණය කිරීම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ විවාදයට සහභාගී වීම
- විසර්ජන පනත් කෙටුම්පතේ සහ කෙටුම්පත් ඇස්තමේන්තුවේ යෝජිත වෙනස් කිරීම් ලැයිස්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීමට සහභාගී වීම -කාරක සභා අවස්ථාවේ විවාදය
- වොරන්ට් බලපත්‍රය සකස් කිරීම හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම
- වියදම් ඒකක හා ආදායම් දෙපාර්තමේන්තු වෙත වියදම් දැරීම සඳහා බලය ලබාදීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

### 1.4.2 2018 වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු වාර්ෂිකව සිදුකරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුලත්ව අදාළ උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම
- අනුමත අරමුදල් සීමාවන් තුළ සුදුසු අරමුණු වෙනුවෙන්ම එම මුදල් ඵලදායීව යොදා ගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා ක්‍රමවේදයක් බලාත්මක කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමග අන්‍යෝන්‍යව කටයුතු කිරීම.
- ව්‍යවස්ථාපිත මණ්ඩල වෙනුවෙන් මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නිර්දේශ කිරීම.
- මූල්‍ය සම්පත් වෙන්කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරීක්ෂණ කෙටුම්පත් කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය මුදල් කාරක සභාවේ සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ සහ වෙනත් පාර්ලිමේන්තු රැස්වීම්වලදී මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවනු ලබන රැස්වීම්වලදී සහ වියදම් කිරීමේ ආයතන මගින් සංවිධානය කරනු ලබන රැස්වීම්වලදී මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම.
- විසර්ජන පනතේ 6 වගන්තිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම.
- අදාළ අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන අයවැය යෝජනාවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- වාර්ෂික ඇස්තමේන්තු සුදුසු ලෙස ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා මු.රෙ.66 සහ මු.රෙ.69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අනුමැතිය ලබාදීම.

### 1.4.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

- වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වියදම් කිරීමේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම්වල සීමා සංශෝධනය කිරීම.

### 1.4.4 අයවැය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම

- අයවැය අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීමට අදාළව උපදෙස් සහ චක්‍රලේඛ නිකුත් කිරීම.
- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන් මගින් ක්‍රියාත්මක කරනු ලබන වර්ෂයේ අයවැය යෝජනා ඇතුළත් සංවර්ධන ව්‍යාපෘතීන්හි මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

### 1.4.5 විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම.

### 1.4.6 කාර්ය සාධනයේ සාරාංශය- 2018

ඉහත සඳහන් කාර්යයන් හා වගකීම්වලට අදාළ ක්‍රියාකාරකම් ගණනාවක් ඉටුකිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇත. එම ක්‍රියාකාරකම්හි කාර්ය සාධනය 1 වගුවේ පැහැදිලිකොට දක්වා ඇත.

1. වගුව - කාර්ය සාධනයේ සාරාංශය 2018

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්යසාධනය |
|---|---|---|---|
| 1. 2018 අයවැය ක්‍රියාත්මක කිරීම හා වියදම් කළමනාකරණය කිරීම | වියදම් පාලනය පිළිබඳ උපදෙස් ලබාදෙමින් චක්‍රලේඛ නිකුත් කිරීම | කාර්යක්ෂම ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම | මේ සම්බන්ධව 2017.12.27 දිනැති අංක 3/2017 දරණ ජාතික අයවැය චක්‍රලේඛය (2018 අයවැය වියදම් සඳහා බලය ලබාදීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය) නිකුත් කරන ලදී. |
| | විසර්ජන පනතේ 6වන වගන්තිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම | වියදම් කිරීමේ ආයතනයන්හි නිසි ක්‍රියාකාරීත්වය සඳහා ඒවායේ අතිරේක අරමුදල් අවශ්‍යතාවය කළමනාකරණය කිරීම | අනුමත වියදම් කිරීමේ සීමාවන් තුළ අරමුදල් මාරු කිරීම කළමනාකරණය කර ගනිමින් විශේෂයෙන්ම ගංවතුර, නියඟ ආදී අනපේක්ෂිත අවස්ථාවන් සඳහා වන වියදම් පියවා ගැනීමට රු.බි. 312.97ක් වන අතිරේක අරමුදල් අවශ්‍යතාවන් 687ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්යසාධනය |
| --- | --- | --- | --- |
| | අතිරේක ප්‍රතිපාදන නිකුත්කිරීම පිළිබඳව වන අතිරේක ප්‍රතිපාදන වාර්තා මාස දෙකකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | විසර්ජන පනතේ ප්‍රතිපාදන පිළිපැදීම | ලබාදී ඇති සියලුම අතිරේක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 08ක් ඉදිරිපත් කරන ලදී. ( 2018 වර්ෂයේ අවසානයේදී පැනනැගුණු ගැටළු හේතුවෙන් ඇතැම් වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය.) |
| | විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මු.රෙ.66 හා 69 යටතේ අරමුදල් මාරු කිරීම සඳහා අවසරය ලබාදීම | අනුමත ඇස්තමේන්තුව තුල වියදම් කළමනාකරණය කර ගැනීම. | එකී රෙගුලාසි අනුව ඉල්ලීම් 1,764 ක් සඳහා අවසර ලබාදෙන ලදී. ඒ අතරින් 266 ක් වැඩසටහන් අතර මාරු කිරීම වූ අතර, 1498 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් විය. මුරෙ 69 යටතේ අනුමැතිය ලබාදුන් ඉල්ලීම් ප්‍රමාණය 50කි. |
| 2. 2019 සඳහා ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම) | සියළුම වියදම් කිරීමේ ආයතන මගින් මාරගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම | අයවැය චක්‍රලේඛය 2018.07.17 දින නිකුත් කරන ලදී. |
| | භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු හා වියදම් කිරීමේ ආයතන සමග සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සැකසීම. | රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පාර්ශවකරුවන් සමග පූර්ව අයවැය සාකච්ඡා පවත්වන ලදී. |
| | අදාළ අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා පැවැත්වීම | සැබෑ අවශ්‍යතා හඳුනාගෙන යථාර්තවාදී අයවැයක් සැකසීම. | භාණ්ඩාගාර ලේකම් , නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරු හා අදාළ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් සමග සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්යසාධනය |
|---|---|---|---|
| | 2019 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම | 2018 ඔක්තෝබර් තුන්වන සතියේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම<br><br>විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් සම්මත කිරීම | 2019 සඳහාවූ විසර්ජන පනත් කෙටුම්පත 2018.09.21 දින ගැසට් පත්‍රයේ පළ කිරීම<br><br>2018.10.09 දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>නමුත් 2018 අවසානයේදී පැවති ගැටළු හේතුවෙන් මෙම පනත් කෙටුම්පත පනතක් බවට පත් නොවිනි. එබැවින් 2019 වර්ෂයේ පළමු මාස 4 හි වියදම් සඳහා අප විසින් 2018.12.21 දින අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන ලද අතර එය එදිනම පාර්ලිමේන්තුවේදී සම්මත විය. |
| 3. අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ ලබාදීම | රාජ්‍ය/ආංශික ප්‍රතිපත්ති හා වියදම් කළමනාකරණය පිළිබඳ විශ්ලේෂණ අධ්‍යයනය කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ හා අර්ථ නිරූපණ නියමිත දිනට ලබාදීම. | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ නියමිත දිනට ඉදිරිපත් කිරීම | වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ 462ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.<br><br>තවද, වෙනත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු විසින් නිරීක්ෂණ ලබාදෙන අමාත්‍ය මණ්ඩල සංදේශ 1,619ක් සඳහා අදහස් දැක්වීම් සිදුකර ඇත. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්යසාධනය |
|---|---|---|---|
| 4.ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | වාර්තා ඉදිරිපත් කිරීම | අවසන් දිනට පෙර වාර්තා ඉදිරිපත් කිරීම<br>(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා වියදම් සමාලෝචනය ලබාදීම<br>(ආ) දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව<br>(ඇ) විසර්ජන ගිණුම<br>(ඈ) රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම | (අ) වියදම් සමාලෝචනය 2018<br>(ආ) කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම<br>(ඇ) විසර්ජන ගිණුම 2018<br>(ඈ) රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම 2018<br>යන වාර්තා නියමිත දිනට ලබාදෙන ලදී. |
| | ධාරිතා ප්‍රවර්ධනය | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්වලට අදාළ වැඩසටහන් පිළිබඳව නිලධාරීන් 16 දෙනෙකු සඳහා විදේශ පුහුණුව හා නිලධාරීන් 71 දෙනෙකු සඳහා දේශීය පුහුණු අවස්ථා ලබාදෙන ලදී. |
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම් පාලනය | අත්තිකාරම් ගිණුම්වල සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සියළු අයදුම්කරුවන්ට ණය/අත්තිකාරම් ලබාදීම. | අනුමත සීමාවන්ට යටත්ව රු.9,933,467.38 ක් වූ ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබාදෙන ලදී. |
| | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | විගණන විමසුම් අවම කිරීම<br>රාජ්‍ය ගිණුම් කාරක සභාවට, රාජ්‍ය මුදල් කාරක සභාවට, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට සහභාගී වීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් එවන ලද සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇත. (විගණන විමසුම් 18) |
| **5 විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි)** | විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම හා අවශ්‍ය විට ඔවුන් සමඟ සාකච්ඡා සඳහා සහභාගී වීම | සංවර්ධන පාර්ශවකරුවන් සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම | සංවර්ධන පාර්ශවකරුවන් සමඟ ඒකාබද්ධ වීම සඳහා යහපත් සබඳතා පවත්වා ගැනීම |

## 2. 2018 අයවැය විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම.

### 2.1 2018 සඳහා විසර්ජන පනත

2018 වර්ෂය සඳහා වූ විසර්ජන පනත, 2018 දෙසැම්බර් මස 09 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද අතර එය 2017 අංක 30 දරණ විසර්ජන පනත වශයෙන් නීතිගත කරන ලදී.

පළමුවන උපලේඛනය, දෙවන උපලේඛනය සහ තුන්වන උපලේඛනය ලෙස උපලේඛන තුනක් විසර්ජන පනතට ඇතුළත් වේ. සෑම උපලේඛනයකටම 2 වගුවේ දක්වා ඇති පරිදි පහත දැක්වෙන වියදම් ඇතුළත් වේ.

**2 වගුව: 2018 සඳහා විසර්ජන පනත**

| | | |
|---|---|---|
| **පළමුවන උපලේඛනය** | වැඩසටහන් අනුව රජයේ සාමාන්‍ය සේවාවන් සඳහා වන වියදම් | මුළු ඇස්තමේන්තුගත වියදම රු.බිලියන 2,143 ක් විය. |
| **දෙවන උපලේඛනය** | නීතියෙන් අධිකාරී බලය ලබාදී ඇති සහ ඒකාබද්ධ අරමුදලෙන් අයවිය යුතු රජයේ වියදම් | විශේෂ නීති යටතේ ඇස්තමේන්තුගත වියදම රු.බිලියන 2,005 කි. |
| **තුන්වන උපලේඛනය** | අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ වියදම් | රාජ්‍ය අයවැයේ වාර්ෂික ඇස්තමේන්තුගත දායකත්වය රු.බිලියන 06 කි. |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

මේ අනුව රජයේ සමස්ත වියදම රු.බිලියන 4,154ක් වූ අතර එයට පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 2,164ක්, මූලධන වියදම් සඳහා රු. බිලියන 834ක් රාජ්‍ය ණය ආපසු ගෙවීම සඳහා රු. බිලියන 1,150ක් සහ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ර.බිලියන 6ක් ඇතුළත් වේ. විසර්ජන පනතේ 2 (1) (ආ) වගන්තිය මගින් රු. බිලියන 1,894 ක ණය ගැනීමේ සීමාවක් දක්වා ඇති අතර 2017 වර්ෂයේ අනුරූපී ණය ගැනීමේ සීමාව රු. බිලියන 1,579ක් විය.

### 2.2 පරිපූරක ඇස්තමේන්තු

ව්‍යාපෘති සඳහා අත්තිකාරම් මුදල් ගෙවීම, දේශීය ණය සඳහා ණය ආපසු ගෙවීම සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘතීන්හි කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් නිරවුල් කිරීම සඳහා මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යවරයා විසින් රු. බිලියන 30ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යවරයාට එම අනුමත පරිපූරක ඇස්තමේන්තුව භාවිතා කිරීමට හැකිවනු පිණිස මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් විශේෂ වොරන්ට් බලපත්‍ර අංක 01 නිකුත් කරන ලදී.

## 2.3 පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර

විසර්ජන පනතේ උපලේඛන 2 හි සඳහන් විශේෂ නීති සේවා හරහා මතුකරන ලද රජයේ විවිධ කාර්යයන් සඳහා වූ අතිරේක අරමුදල් අවශ්‍යතා සපුරාලීම පිණිස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය තුළ විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර අටක් (8) ක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

### 3 වගුව: පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර

| අංකය | වියදම | | කාර්යය/අරමුණ | ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|
| | ශීර්ෂය | ආයතනය | | |
| 01 | 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2/2018 මගින් විනිසුරුවන්ගේ වැටුප් සංශෝධනය කිරීම | 9,500,000 |
| 02 | 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/ඒසීසී/සීසීයු/01/02 දරණ 2018.08.16 දිනැති ලිපිය අනුව ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයින්ගේ වැටුප් සංශෝධනය කිරීම | 826,000 |
| 03 | 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/ඒසීසී/සීසීයු/01/02 දරණ 2018.08.16 දිනැති ලිපිය අනුව ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයින්ගේ වැටුප් සංශෝධනය කිරීම | 1,085,000 |
| 04 | 20 | මැතිවරණ කොමිෂන් සභාව | ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/ඒසීසී/සීසීයු/01/02 දරණ 2018.08.16 දිනැති ලිපිය අනුව ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයින්ගේ වැටුප් සංශෝධනය කිරීම | 455,000 |
| 05 | 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/ඒසීසී/සීසීයු/01/02 දරණ 2018.08.16 දිනැති ලිපිය අනුව ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයින්ගේ වැටුප් සංශෝධනය කිරීම | 720,000 |
| 06 | 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු චක්‍රලේඛ 7/2016 අනුව 2015 සිට 2019 දක්වා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සඳහා දායකත්ව ගාස්තු | 191,200,000 |
| 07 | 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | ජනාධිපති ලේකම්ගේ අංක පීඑස්/ඒසීසී/සීසීයු/01/02 දරණ 2018.08.16 දිනැති ලිපිය අනුව ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයින්ගේ වැටුප් සංශෝධනය කිරීම | 835,000 |
| 08 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ණය සේවාකරණය මත වෙන් කරන ලද ප්‍රතිපාදන ඌනතාවය සපුරාලීම සඳහා | 119,779,150,000 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## 2.4 2018 අයවැයෙහි කාර්යසාධනය

2018 වර්ෂයේ රජයේ සමස්ත සත්‍ය වියදම රු.බිලියන 3,971 ක් වූ අතර, එය 2017 වර්ෂයෙහි වියදම් වූ රු.බිලියන 3,470 ට සාපේක්ෂව රු.බිලියන 501 කින් වැඩිවී ඇත. මෙය රු. බිලියන 4,148 ක් වූ ඇස්තමේන්තුගත වියදමට සාපේක්ෂ වූ අතර, එය ඇස්තමේන්තුගත වියදමට වඩා රු.බිලියන 177 ක අඩුවීමකි. කෙසේවුවද, 2018 වර්ෂයේ අයවැය ප්‍රතිපාදනවල සමස්ත උපයෝජන අනුපාතය සියයට 96 ක් වූ අතර, එය 2017 වර්ෂයේ සියයට 96ක් වූ කාර්යසාධනයට සමාන වූ අගයකි.

විසර්ජන පනතේ 2(1) වගන්තිය යටතේ අධිකාරී බලය ලද ප්‍රතිපාදන (සැපයුම් සේවා සඳහා වන වියදම්) වලින් වර්ෂය තුල වියදම් දරා තිබුණේ සියයට 86 ක් පමණක් වන අතර එය 2017 වර්ෂයේ සියයට 87ක් වූ අගයට වඩා අඩුවීමකි. එයට සමගාමීව රජයේ ප්‍රාග්ධන වියදම් උපයෝජනය කිරීම, රු. බිලියන 834ක් වූ මූලික ඇස්තමේන්තුවෙන් රු. බිලියන 625 ක් හෝ සියයට 75 ක් ලෙස පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කරන අතර 2017 වර්ෂයේදී එම අගය සියයට 75 ක් විය. පුනරාවර්තන වියදම් උපයෝජනය කිරීම සියයට 97ක් හෝ රු. බිලියන 2,164ක් ලෙස පැවතිනි.

පසුගිය වසර කිහිපය තුළ පැවති ප්‍රවණතාවන්ගෙන් පසුව විශේෂ නීති සේවා වියදම් ඇස්තමේන්තුව (මූල්‍යන සංකේත 21-විසර්ජන පනතේ දෙවන උප ලේඛනය) රු. බිලියන 2,005 ක් වූ මුල් ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 118ක ඉක්මවා යාමක් පෙන්නුම් කරයි. රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ණය සේවාකරණය ඉහළ යාම, LIBOR අනුපාත ඉහළ යාම සහ පසුගිය මාස 24 තුළ සමස්තයක් ලෙස දේශීය හා විදේශීය ණය පොලී අනුපාත ඉහළ යාම මගින් ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

මුළු ඇස්තමේන්තුව වූ රු. බිලියන 2,143 කට සාපේක්ෂව විසර්ජන පනතේ 1 වන උපලේඛනයට අදාළ වියදම රු.බිලියන 1,848ක් වූ අතර, සියයට 86ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. වැඩසටහන 1-මෙහෙයුම් කටයුතු හා වැඩසටහන 2- සංවර්ධන කටයුතු යන වැඩසටහන් ද්විත්වයේම සත්‍ය වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

### 4 වගුව: අයවැය ප්‍රතිපාදන උපයෝජනය 2017-2018

| (රු.බිලියන) | | | | |
|---|---|---|---|---|
| වියදම් කාණ්ඩය | 2017 | | 2018 | |
| | ඇස්තමේන්තුව | වියදම | ඇස්තමේන්තුව | වියදම |
| **විසර්ජන පනත (1 වන උපලේඛනය)** | **2,113** | **1,832** | **2,143** | **1,848** |
| වැඩසටහන 1 | 965 | 1,011 | 1,087 | 1,052 |
| වැඩසටහන 2 | 1,148 | 821 | 1,056 | 796 |
| **විශේෂ නීතිසේවා (2 වන උපලේඛනය)** | **1,515** | **1,638** | **2,005** | **2,123** |
| **අත්තිකාරම් ගිණුම් ( 3 වන උපලේඛනය)** | **5** | **4** | 6 | 4 |
| **එකතුව** | **3,628** | **3,470** | **4,148** | **3,971** |

***මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව***

2017 සහ 2018 වර්ෂයන්හි රජයේ වියදම්වල මූල්‍යකරණ ප්‍රභවයන් 5 වගුව මගින් පෙන්නුම් කරයි.

## 5 වගුව: රජයේ වියදම්වල මූල්‍යකරණ ප්‍රභවයන්

| මූල්‍යකරණ අංකය | මූල්‍යකරණ ප්‍රභවය | 2017 රු.බිලියන | 2018 රු.බිලියන |
|---|---|---|---|
| 11 | දේශීය අරමුදල් | 1,572.2 | **1,617.0** |
| 12 | විදේශීය ණය | 214.7 | 180.1 |
| 13 | විදේශීය ප්‍රදාන | 6.3 | **9.0** |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | 2.1 | **3.8** |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | **0.1** | **0.1** |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | 0.5 | **0.1** |
| 17 | විදේශ අරමුදල් ආශ්‍රිත දේශීය පිරිවැය | 35.6 | 31.9 |
| 18 | විදේශ අරමුදල් ආශ්‍රිත දේශීය සම-මූල්‍යකරණය | - | 5.7 |
| 21 | විශේෂ නීති සේවා | **1,638.0** | **2,122.9** |
| **Total** | | **3,469.7** | **3,970.6** |

*මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

## 6 වගුව: ප්‍රතිපාදන උපයෝජනය කිරීම

රු.මිලියන

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂයමගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| විශේෂ වියදම් ඒකක | 25,472 | 1,464 | 13 | 26,949 | 19,780 | 7,169 |
| බුද්ධශාසන | 1,463 | 1,262 | | 2,725 | 2,324 | 402 |
| මුදල් හා ජන මාධ්‍ය | 63,092 | 9,919 | | 73,012 | 46,266 | 26,746 |
| ආරක්ෂක | 290,711 | 7,921 | | 298,633 | 282,747 | 15,886 |

රු.මිලියන

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂයමගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 29,178 | 27,054 | 191 | 56,423 | 27,443 | 28,980 |
| ආපදා කළමනාකරණ | 5,811 | 6,812 | | 12,623 | 11,277 | 1,346 |
| තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු | 13,531 | 182 | | 13,713 | 13,601 | 111 |
| අධිකරණ | 11,150 | 2,258 | | 13,408 | 11,821 | 1,587 |
| සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය | 178,400 | 8,433 | | 186,833 | 169,016 | 17,817 |
| විදේශ කටයුතු | 10,779 | 2,050 | | 12,829 | 12,436 | 393 |
| ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 42,137 | 14,721 | | 56,857 | 52,157 | 4,701 |
| උසස් අධ්‍යාපන හා මහාමාර්ග | 182,757 | 55,954 | 30,000 | 268,711 | 228,554 | 40,157 |
| කෘෂිකර්ම | 23,790 | 34,907 | | 58,697 | 49,145 | 9,553 |
| විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 838 | 337 | | 1,175 | 993 | 182 |
| කාන්තා හා ළමා කටයුතු | 3,009 | 5,930 | | 8,939 | 8,340 | 599 |
| ස්වදේශ කටයුතු | 44,100 | 7,926 | | 52,026 | 46,378 | 5,648 |
| ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ | 9,097 | 59 | | 9,157 | 8,272 | 885 |
| නිවාස හා ඉදිකිරීම් | 11,248 | 894 | | 12,141 | 10,238 | 1,904 |
| සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමයන් | 18,579 | 52,095 | | 70,674 | 67,294 | 3,380 |
| අධ්‍යාපන | 102,880 | 3,699 | | 106,579 | 77,451 | 29,128 |
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ | 233,864 | 144 | | 234,008 | 229,875 | 4,133 |

රු.මිලියන

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂයමගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| වැවිලි කර්මාන්ත | 8,645 | 458 | | 9,103 | 7,064 | 2,039 |
| ක්‍රීඩා | 5,425 | 3,026 | | 8,451 | 3,766 | 4,685 |
| උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 3,748 | 5 | | 3,753 | 2,575 | 1,178 |
| පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු | 11,426 | 3,656 | | 15,081 | 12,385 | 2,696 |
| ප්‍රාදේශීය සංවර්ධන | 973 | 5 | | 978 | 756 | 221 |
| සංවර්ධන කාර්යභාර | 1,292 | 18 | | 1,311 | 366 | 945 |
| කර්මාන්ත හා වානිජ | 9,081 | 3,570 | | 12,651 | 6,422 | 6,229 |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන | 309 | 19 | | 328 | 277 | 51 |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 7,758 | 2,571 | | 10,329 | 5,621 | 4,708 |
| ග්‍රාමීය ආර්ථික කටයුතු | 7,239 | 741 | | 7,980 | 5,338 | 2,642 |
| පළාත් පාලන හා පළාත් සභා | 218,217 | 11,691 | | 229,909 | 215,518 | 14,391 |
| ජාතික සහජීවන , ජාතික සංවාද සහ රාජ්‍ය භාෂා | 763 | 296 | | 1,059 | 893 | 166 |
| රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන | 5,572 | 701 | | 6,274 | 1,088 | 5,185 |
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු | 1,024 | 512 | | 1,536 | 674 | 862 |
| මහවැලි සංවර්ධන හා පරිසර | 45,611 | 1,868 | | 47,479 | 40,884 | 6,595 |
| තිරසර සංවර්ධන හා වනජීවී | 4,779 | 255 | | 5,034 | 3,699 | 1,335 |
| මහානගර හා බස්නාහිර සංවර්ධන | 51,109 | 10,370 | | 61,479 | 32,332 | 29,147 |
| අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 8,545 | 1,209 | | 9,754 | 7,041 | 2,713 |

රු.මිලියන

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂයමගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන | 2,770 | 4,883 | | 7,653 | 2,985 | 4,668 |
| නගර සැලසුම් හා ජල සම්පාදන | 27,862 | 7,521 | | 35,383 | 32,701 | 2,682 |
| විශේෂ කාර්යභාර | 105 | 4 | | 109 | 31 | 78 |
| වරාය හා නාවික කටයුතු | 2,548 | 1,356 | | 3,904 | 1,547 | 2,357 |
| විදේශ රැකියා | 686 | - | | 686 | 567 | 119 |
| නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන | 82,899 | 756 | | 83,655 | 76,193 | 7,462 |
| කම්කරු හා වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන | 5,231 | 23 | | 5,254 | 4,088 | 1,166 |
| විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් | 2,270 | 3,520 | | 5,790 | 3,525 | 2,265 |
| සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ | 2,097 | 4,253 | | 6,350 | 2,202 | 4,148 |
| විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ | 5,643 | 1,054 | | 6,697 | 4,945 | 1,753 |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු | 10,882 | 331 | | 11,213 | 9,751 | 1,462 |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 24,631 | 3,942 | | 28,573 | 18,933 | 9,640 |
| ප්‍රාථමික කර්මාන්ත | 3,511 | 166 | | 3,677 | 2,513 | 1,165 |
| **ණය සේවා ගෙවීම්** | **1,970,000** | **170** | **119,779** | **2,089,949** | **2,088,551** | **1,398** |
| **භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය** | **313,307** | **(312,973)** | | **334** | | **334** |
| **මුළු එකතුව** | **4,147,845** | | **149,984** | **4,297,829** | **3,970,636** | **327,193** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව/රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

## 2.5. අත්තිකාරම් ගිණුම් කටයුතු

අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වූ ඇස්තමේන්තුගත උපරිම වියදම් සීමාව රු.බිලියන 27.63 ක් වූ අතර සත්‍ය වියදම රු.බිලියන 25.79 ක් විය. ඇස්තමේන්තුගත අවම ලැබීම් සීමාව රු.බිලියන 21.63 ක් වූ නමුත්, සත්‍ය මුළු ලැබීම් ප්‍රමාණය රු.බිලියන 21.93 ක් විය. ඒ අනුව, අත්තිකාරම් ගිණුම් කටයුතු 2017 අංක 30 දරණ විසර්ජන පනතේ සඳහන් අනුමත සීමාවන් තුල සිදුකර ඇත. මෙම අත්තිකාරම් ගිණුම් කටයුතුවලට වාණිජමය ස්වභාවයේ ක්‍රියාකාරකම් මෙන්ම, දේපළ ණය හැර රාජ්‍ය සේවකයින් සඳහා අත්තිකාරම් ලබාදීමද අන්තර්ගත වේ.

## 2.6. 2018 අයවැය කළමනාකරණය

### 2.6.1 අරමුදල් මාරු කිරීම (වීරමොං පටිපාටිය)

වීරමොං පටිපාටිය යටතේ සහ විසර්ජන පනතේ 5 වන වගන්තිය පරිදි, මුදල් රෙගුලාසි සහ මුද්‍රිත ඇස්තමේන්තුවල දක්වා ඇති නියමයන් අනුගමනය කරමින් පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති මුළු වියදම් සීමාවන් ඇතුලත උපයෝජනය කර නොමැති ප්‍රතිපාදන මාරු කිරීමට මහා භාණ්ඩාගාරය මගින් අනුමැතිය ලබාදෙන ලදී. 2018 වර්ෂය තුළදී අරමුදල් මාරු කිරීම සඳහා වූ ඉල්ලීම් 1,764ක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් මුරෙ 66 හා මුරෙ 69 යටතේ අනුමැතිය ලබාදී ඇත.

### 2.6.2 පරිපූරක සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම්

වියදම් කිරීමේ ආයතනයන්හි පුරෝකථනය කළ නොහැකි හදිසි අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන සලසා දීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදී.

අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපාදන ද ඇතුලත්ව මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ සමස්ත ප්‍රතිපාදනය රු.බිලියන 313ක් වූ අතර ඒ තුල අයවැය යෝජනා සඳහා රු.බිලියන 95 ක් සහ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. බිලියන 130ක් විය. මෙම අමතර ප්‍රතිපාදන 2018 වර්ෂයේ මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවෙහි දක්වා ඇති විශේෂිත උපදෙස් මාලාවට අනුව වියදම් කිරීමේ ආයතන අතර බෙදාහැර ඇත. ලබාදී ඇති ප්‍රතිපාදන පිළිබඳ සාරාංශයක් 7 වගුවේ දක්වා ඇත.

**7 වගුව: විසර්ජන පනතේ 6 වන වගන්තිය යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය**

| | මුද්‍රිත ඇස්තමේන්තුවල දක්වා ඇති කාර්යය | ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|---|
| 1 | සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන | 101 |
| 2 | අනපේක්ෂිත වියදම් සඳහා ප්‍රතිපාදන | 99 |
| 3 | අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන | 62 |
| 4 | බදු සහ තීරුබදු ඇතුළත්ව විදේශ මූල්‍යන සහ ආශ්‍රිත ප්‍රතිපාර්ශවීය අරමුදල් මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති ඇතුළත් මූලධන වියදම්හි ඌනතා සපුරාලීම සඳහා | 51 |
| **එකතුව** | | **313** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

විසර්ජන පනතේ 6(1) ඡේදය අනුව මාරු කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය සහ එම මාරු කිරීමට හේතුව දැක්වෙන වාර්තාවක් එකී මාරු කිරීම් සිදුකරන ලද දින සිට මාස දෙකක කාලයක් ඇතුලත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව, 2003 අංක 3 දරණ රාජ්‍ය මූල්‍ය(වගකීම්) පනත අනුව මෙම ප්‍රතිපාදනවලින් සිදුකරන ලද සියළුම මාරු කිරීම් පිළිබඳ තොරතුරු 2018 වර්ෂයේ රජයේ රාජ්‍ය මූල්‍ය කාර්යසාධන වාර්තාවට සහ 2018 වාර්ෂික වාර්තාවට ඇතුලත්කරන ලදී. අවසන් වශයෙන්, ඉදිරි වර්ෂය වෙනුවෙන් මුද්‍රිත ඇස්තමේන්තුවලට අදාළ වැය විෂය යටතේ සත්‍ය ප්‍රතිපාදන භාවිතය පිළිබඳව තොරතුරු ඇතුලත් කර ඇත.

### 2.6.3 අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම

වියදම් කිරීමේ ආයතනවල වියදම් කළමනාකරණය සඳහා උපදෙස් ලබාදෙමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් චක්‍රලේඛ නිකුත් කරන ලදී. 2018 මූල්‍ය වර්ෂය තුලදී අයවැය සකස් කිරීම, අධීක්ෂණය කිරීම සහ වියදම් සඳහා බලය ලබාදීම යන අංශ යටතේ චක්‍රලේඛ පහක් පහත දක්වා ඇති පරිදි නිකුත් කර ඇත.

**8 වගුව: අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම**

| | දිනය | චක්‍රලේඛ අංකය | මාතෘකාව |
|---|---|---|---|
| 1 | 04.04.2018 | ජාතික අයවැය චක්‍රලේඛ 01/2018 | 2017 මූල්‍ය වර්ෂයට අදාළ නොපියවූ බැරකම් නිරවුල් කිරීම |
| 2 | 01.06.2018 | ජාතික අයවැය චක්‍රලේඛ 02/2018 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින සියළුම සංවර්ධන ව්‍යාපෘතීන්හි තොරතුරු අන්තර්ගත කරමින් බහුකාර්ය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම |
| 3 | 16.07.2018 | ජාතික අයවැය චක්‍රලේඛ 03/2018 | රාජ්‍ය ආයතන සඳහා වාහන ලබාගැනීම |
| 4 | 17.07.2018 | ජාතික අයවැය චක්‍රලේඛ 04/2018 | අයවැය කැඳවීම-2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදෙස් |
| 5 | 27.12.2018 | ජාතික අයවැය චක්‍රලේඛ 05/2018 | වියදම් දැරීම සඳහා බලය දීම- අතුරු සම්මත ගිණුම-2019 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## 3. 2018 සඳහා අයවැය ඇස්තමේන්තු සැකසීම

රටෙහි ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් යුතුව රජයේ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවන් මත පදනම්ව 2018 - 2020 මධ්‍ය කාලීන වියදම් රාමුව තුල 2018 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකසන ලදී. ඒ අනුව, සියයට 6 ඉක්මවූ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම පිණිස රාජ්‍ය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් සියයට 5.3 ක ප්‍රමාණයකින් හෝ මධ්‍යකාලීනව වර්ධනය කළයුතු බව 2018 අයවැයෙන් අපේක්ෂා කෙරිනි.

## 3.1 අයවැය සැකසීමේ මාර්ගෝපදේශ

2018 අයවැය කැඳවුම, වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැකසීම සඳහා මාර්ගෝපදේශ හා නියෝගයන් ද ඇතුලත්ව ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2017 ලෙස නිකුත් කෙරින. ඒ අනුව, රජයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුවට අනුව 2018 අයවැය සැකසීම සඳහා මාර්ගෝපදේශ ලබාදී තිබිණි. මේ අතර වසර 2030 වන විට තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීම පිළිබඳව අයවැය සකස් කිරීමේදී පුළුල් අවධානයක් යොමු කෙරිනි.

තවද, පසුගිය වර්ෂ වලදී ක්‍රියාත්මක කරන ලද ශූන්‍ය පාදක අයවැය ප්‍රවේශයේ අත්දැකීම් භාවිතා කරමින් 2018 අයවැය, කාර්ය සාධනය මත පදනම් වූ අයවැය ප්‍රවේශය මත සකස් කරන ලදී.

# 4. විශේෂ ක්‍රියාකාරකම්

## 4.1 රාජ්‍ය ආයතනවල අයවැය කළමනාකරණය

අයවැය ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන සැලසෙන රාජ්‍ය ආයතන 117 (ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරි, කොමිෂන් සභා, විශ්ව විද්‍යාල ආදිය) ආශ්‍රිත කටයුතුවල වගකීම ජාතික අයවැය දෙපාර්තමේන්තුව සතුවේ. ඒ අනුව වර්ෂය තුළදී පහත සඳහන් කටයුතු/ක්‍රියාකාරකම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

- 1971 අංක 38 දරණ මුදල් පනතේ 2(ආ) වගන්තිය අනුව රු.500,000/- ට වැඩි ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම.
- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් යුතුව පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳ මාසික මුදල් අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ ඉල්ලීම් නිර්දේශ කිරීම
- වාර්ෂික අයවැය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික ගිණුම් හා වාර්ෂික වාර්තා විශ්ලේෂණය මගින් මෙම ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්ය සාධනය හා ප්‍රගතිය විමර්ශනය කිරීම
- ව්‍යවස්ථාපිත ආයතන මගින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම
- සවිස්තරාත්මක නිරීක්ෂණයකින් පසුව එම ඉල්ලීම් සඳහා අතිරේක ප්‍රතිපාදන ලබාදීම
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) රැස්වීම් පාර්ලිමේන්තුවේදී පැවැත්වෙන විට ඒ සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්යසාධනය හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා සහාය දැක්වීම.
- මෙම ආයතන සඳහා අවශ්‍ය වාහන මිලදී ගැනීමට අනුමැතිය ලබාදීම.
- විගණකාධිපතිගේ විගණන විමර්ශන වාර්තා හා මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන විශේෂ විගණන විමසුම් සමාලෝචනය කිරීම. මෙම විමසුම් විසඳීම පිණිස අදාළ ව්‍යවස්ථාපිත මණ්ඩල සමග සම්බන්ධීකරණය කිරීම හා එවැනි විගණන විමසුම් අනාගතයේ ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීම.
- අයවැය ප්‍රතිපාදනවල ප්‍රමාණය හා මෙම ආයතනවල සැබෑ අවශ්‍යතාවලට අනුව, ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම පිළිබඳ වූ නිර්දේශ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- මෙම ආයතන වල නිලධාරීන්ට දේශීය අරමුදල් භාවිතා කරමින් විවිධ අරමුණු සඳහා විදේශ ගමන්වල යෙදීමට අනුමැතිය ලබාදීම (පුහුණු රැස්වීම්, සම්මන්ත්‍රණ, සාකච්ඡා ආදිය)
- මහා පරිමාණ ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආදී වෙනත් මූල්‍ය හා කළමනාකරණ ගැටළු පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට උපදෙස් දීම හා සම්බන්ධීකරණ කටයුතු

## 4.2 අමාත්‍ය මණ්ඩල සංදේශ

2018 වසර තුළ රේඛීය අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 462 ක් සඳහා ගරු මුදල් අමාත්‍යතුමන්ගේ නිරීක්ෂණ සකස් කරන ලදී. තවද, පහත කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ 16ක් මුදල් අමාත්‍යතුමාගේ අත්සන සහිතව ඉදිරිපත් කරන ලදී.

**9 වගුව: ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ**

| | දිනය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | කාරණය |
|---|---|---|---|
| 1 | 2018.01.15 | එම්එෆ්/එන්බී/01/සීඑම්/2018/008 | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම සඳහා රජයේ ආයතන වලින් අයවිය යුතු හිඟ මුදල් ගෙවීම |
| 2 | 2018.01.29 | එම්එෆ්/එන්බී/02/සීඑම්/2018/018 | 2017 මූල්‍ය වර්ෂයට අදාළ හිඟ බැඳීම් නිරවුල් කිරීම |
| 3 | 2018.03.16 | එම්එෆ්/එන්බී/12/සීඑම්/2018/052 | 2017 මූල්‍ය වර්ෂයට අදාළ හිඟ බැඳීම් නිරවුල් කිරීම |
| 4 | 2018.03.24 | එම්එෆ්/එන්බී/04/සීඑම්/2018/053 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සඳහා වන අත්තිකාරම් ගිණුම් සීමාවන් සංශෝධනය කිරීම-2017 |
| 5 | 2018.03.26 | එම්එෆ්/එන්බී/03/සීඑම්/2018/041 | රජයේ ආයතන සඳහා වාහන ලබා ගැනීම |
| 6 | 2018.04.02 | එම්එෆ්/එන්බී/03/සීඑම්/2018/051 | 2017 මූල්‍ය වර්ෂයේ හතරවන කාර්තුව අවසානයේ සත්‍ය වියදම හා ආදායම් එකතුව පිළිබඳ වාර්තාව |
| 7 | 2018.05.16 | එම්එෆ්/එන්බී/සීඑම්/2018/93 | බලපෑමට ලක්වූ කලමැටිය (ආදර්ශ) ධීවරයින් සඳහා සහන සැලසීම |
| 8 | 2018.05.21 | එම්එෆ්/එන්බී/07/සීඑම්/2018/103 | 2017 ගංවතුරින් බලපෑමට ලක්වූ නිවාස සඳහා ගෙවීම් සිදු කිරීම කඩිනම් කිරීම |
| 9 | 2018.06.04 | එම්එෆ්/එන්බී/සීඑම්/2018/72 | ලංකා ධීවර සංස්ථාව හරහා උත්සව කාලසීමාවේදී මත්ස්‍ය මිල ගණන් පාලනය කිරීම |
| 10 | 2018.07.09 | එම්එෆ්/එන්බී/සීඑම්/2018/72 | නව අමාත්‍ය මණ්ඩල සංශෝධනය සහ නව සංවර්ධන ප්‍රමුඛතාවන්ට අනුව 2017 අංක 30 දරණ විසර්ජන පනත සංශෝධනය කිරීම |
| 11 | 2018.07.17 | එම්එෆ්/එන්බී/07/සීඑම්/2018/105 | 2018 මූල්‍ය වර්ෂයේ පළමුවන කාර්තුවේදී සත්‍ය වියදම, ආදායම් එකතුව හා භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තාව |
| 12 | 2018.09.14 | බීඩී/සීබීපී/4/1/4/2019 | 2019 මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත |
| 13 | 2018.09.17 | එම්එෆ්/එන්බී/12/සීඑම්/2018/198 | මාතර නිල්වලාඑළිය සංවර්ධන ව්‍යාපෘතිය: 2018-2020 |
| 14 | 2018.09.30 | එම්එෆ්/එන්බී/13/සීඑම්/2018/2017(217) | නව අමාත්‍ය මණ්ඩල සංශෝධනය අනුව 2017 අංක 30 දරණ විසර්ජන පනත සංශෝධනය කිරීම |

| | දිනය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | කාරණය |
|---|---|---|---|
| 15 | 2018.11.19 | එම්එෆ්/එන්බී/14/සීඑම්/2018/251 | 2019 වර්ෂය සඳහා අයවැය සකස් කිරීම |
| 16 | 2018.11.24 | එම්එෆ්/එන්බී/15/සීඑම්/2018/259 | අතුරු සම්මත ගිණුම -2019 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### 4.3 මණ්ඩල හා කමිටු සඳහා කාර්ය මණ්ඩලය සහභාගී වීම

මෙම දෙපාර්තමේන්තුවේ සිටින මාණ්ඩලික නිලධාරීන් ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සංස්ථා, රජයට අයත් සමාගම්වල හා උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල/සභාවල භාණ්ඩාගාර නියෝජිතයින් වශයෙන් සේවය කරන අතර, ඇතැම් නිලධාරීහු භාණ්ඩාගාර ලේකම් නියෝජනය කරමින් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන මණ්ඩල, තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් වශයෙන් සේවය කරති. ඊට අමතරව, මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීහු දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය මුදල් කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ රැස්වීම්වලට සහභාගී වෙති. තවද, නිලධාරීන් අදාළ කරුණු පිළිබඳ තම යෙදවුම්/ අදහස් ලබාදීම සඳහා අමාත්‍යාංශයන්හි මෙන්ම භාණ්ඩාගාරයේද පවත්වනු ලබන රැස්වීම් සඳහා සහභාගී වෙති.

## 5. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්යය භාරය

වියදම් ඇස්තමේන්තු ව්‍යුහය අනුව සහ රේඛීය අමාත්‍යාංශ අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්යභාරය සකස් වී ඇත.

### 5.1 කාර්යය මණ්ඩලය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව, 2018 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය තුළ පහත සඳහන් සේවා මට්ටම් වල සිටින නිලධාරීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| සේවා මට්ටම | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 38 |
| තෘතීය මට්ටම | 04 |
| ද්විතීය මට්ටම | 68 |
| ප්‍රාථමික මට්ටම | 38 |

2018 වසර අවසාන වනවිට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සැබෑ සේවක සංඛ්‍යාව 10 වගුව පරිදි විය.

**10 වගුව: 2018 වසරේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව**

| තනතුර | සේවාව | ශ්‍රේණිය/ පන්තිය | වැටුප් පරිමාණය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | ස්ථිර | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL-3 | 1 | 1 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL-3 | 2 | 0 | 2 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | විශේෂ | SL-3 | 2 | 0 | 2 |
| අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL-1 | 9 | 8 | 1 |
| අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | I | SL-1 | 5 | 5 | 0 |
| අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ග.සේ. | I | SL-1 | 2 | 2 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | II/III | SL-1 | 11 | 10 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ග.සේ. | II | SL-1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | II / III | SL-1 | 4 | 3 | 1 |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | III | SL-1 | 1 | 0 | 1 |
| එකතුව | | | | **38** | **29** | **9** |
| **තෘතීය මට්ටම** | | | | | | |
| පරිපාලන නිලධාරී | රා.ක.සේ. | අධි ශ්‍රේණිය | MN-7 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | භා.ප.සේ. | I/II/III | MN-6 | 2 | 2 | 0 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | තො.තා.සේ. | I/II/III | MN-6 | 1 | 1 | 0 |
| එකතුව | | | | **4** | **3** | **1** |
| **ද්විතීය මට්ටම** | | | | | | |
| කළමනාකරණ සහකාර | රා.ක.සේ. | I/II/III | MN-2 | 23 | 22 | 1 |
| සංවර්ධන සහකාර | සං.නි.සේ. | I/II/III | MN-4 | 45 | 38 | 7 |
| එකතුව | | | | **68** | **60** | **8** |
| **ප්‍රාථමික මට්ටම** | | | | | | |
| රියදුරු | රි.සේ. | I/II/III | PL-3 | 19 | 17 | 2 |
| කාර්යාල කාර්ය සහායක | කා.කා.සේ. | I/II/III | PL-1 | 19 | 19 | 0 |
| එකතුව | | | | **38** | **36** | **2** |
| **උප එකතුව** | | | | **148** | **128** | **20** |

## 5.2 මානව සම්පත් සංවර්ධනය

2018 වසරේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තම රාජකාරි මට්ටමින් සහභාගී වූ විවිධ රැස්වීම්වලට අමතරව, ඔවුන්ගේ වෘත්තීය නිපුණතා හා වැඩ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිණිස පහත දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට හැකි විය.

### 5.2.1 විදේශීය පුහුණු / සම්මන්ත්‍රණ / රැස්වීම්

2018 වසරේදී පහත මාණ්ඩලික නිලධාරීන්ට විවිධ ක්ෂේත්‍රවල විදේශීය පුහුණුව ලබාදෙන ලදී.

**11 වගුව: 2018 වර්ෂයේ විදේශ පුහුණු හා වැඩමුළු සාරාංශය**

| 2018 වර්ෂයේ විදේශ පුහුණු හා වැඩමුළු සාරාංශය | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | රට | කාල සීමාව |
| 1 | ඒ කේ සෙනෙවිරත්න මයා | අධ්‍යක්ෂ ජනරාල් | රාජ්‍ය ණය කළමනාකරණය හා පුහුණු පාඨමාලාව | තායිලන්තය | 07.05.2018 - 12.05.2018 |
| 2 | වයි පී සුමනාවතී මිය | අධ්‍යක්ෂ | අයවැය ආයතන ශක්තිමත් කිරීම | සිංගප්පූරුව | 23.07.2018- 27.07.2018 |
| | | | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන් සඳහා හැකියා ප්‍රවර්ධන වැඩසටහන | මලයාසියාව | 07.10.2018 - 13.10.2018 |
| 3 | එම් අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ | තිරසර ඊ - රාජ්‍ය වියදම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 26.02.2018 - 02.03.2018 |
| 4 | බියංකා එන් ගමගේ මෙය | අධ්‍යක්ෂ | තිරසර ඊ - රාජ්‍ය වියදම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 26.02.2018 - 02.03.2018 |
| 5 | ඒ වී ජනාදර මයා | අධ්‍යක්ෂ | ආසියා පැසිෆික් නගර සඳහා නාගරික රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාර්මික වැඩමුළුව | බැංකොක් | 08.11.2018 - 09.11.2018 |
| 6 | ටී ඩී පී ලියනගේ මිය | අධ්‍යක්ෂ | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් අයවැයකරණය පිළිබඳ වැඩමුළුව | ඉන්දියාව | 26.03.2018 - 28.03.2018 |
| | | | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ විශ්වීය ආර්ථික පාලනය පිළිබඳ අමාත්‍ය වැඩමුළුව 2018 | චීනය | 06.06.2018 - 12.06.2018 |

| 2018 වර්ෂයේ විදේශ පුහුණු හා වැඩමුළු සාරාංශය | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | රට | කාල සීමාව |
| 7 | සමන්ති මීතලාව මිය | අධ්‍යක්ෂ | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් අයවැයකරණය පිළිබඳ වැඩමුළුව | ඉන්දියාව | 26.03.2018-28.03.2018 |
| 8 | එස් අයි එම් රෝසා මයා | අධ්‍යක්ෂ | සංවර්ධිත රටවල මූල්‍ය යටිතල පහසුකම් | ජපානය | 12.04.2018 |
| | | | ශ්‍රී ලංකාව සඳහා රාජ්‍ය පරිපාලනය හා ඊ රාජ්‍ය පිළිබඳ පුහුණුව | චීනය | 06.11.2018-26.11.2018 |
| 9 | ජේ ජයසුන්දර මයා | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පන්තියේ නිලධාරීන් සඳහා වූ හැකියා ප්‍රවර්ධන වැඩසටහන | මලයාසියාව | 03.09.2018-09.09.2018 |
| 10 | ඩී ඒ එස් දහනායක මිය | සහකාර අධ්‍යක්ෂ | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහාවූ දකුණු - දකුණු සහයෝගීතාවය 2018 | චීනය | 10.07.2018-30.07.2018 |
| 11 | එම් ජේ එම් ඉෆාම් මයා | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා රාජ්‍ය නිලධාරීන් සඳහා වන ණය මාර්ගෝපදේශ හා ක්‍රියාමාර්ග පිළිබඳ වැඩමුළුව | ඉන්දියාව | 12.01.2018-13.01.2018 |
| | | | රාජ්‍ය මූල්‍ය විශ්ලේෂණය හා පුරෝකථනය | ඉන්දියාව | 30.04.2018-04.05.2018 |
| 12 | එල් කේ එන් යූ ප්‍රේමරත්න මෙය | තොරතුරු තාක්ෂණ නිලධාරී | තිරසර ඊ - රාජ්‍ය වියදම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | සිංගප්පූරුව | 26.02.2018 - 02.03.2018 |

## 12 වගුව: 2018 වර්ෂයේ විදේශ සමුළු හා සම්මන්ත්‍රණ සාරාංශය

| විදේශ සමුළු හා සම්මන්ත්‍රණ සාරාංශය - 2018 | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | රට | කාල සීමාව |
| 1 | ඒ කේ සෙනෙවිරත්න මයා | අධ්‍යක්ෂ ජනරාල් | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - මූල්‍ය සංසදය - දූෂණය හා රාජ්‍ය අංශයේ පාලනය | වොෂින්ටන් ඩී සී | 16.04.2018 - 25.04.2018 |
| 2 | කේ ජී කේ විමලවීර මෙය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | නිදහස් පාලන කමිටු රැස්වීම | ඇ.එ.ජ. | 14.03.2018-18.03.2018 |
| 3 | ඒ වී ජනාදර මයා | අධ්‍යක්ෂ | මූල්‍ය සංසදය 2018 | චීනය | 07.12.2018 - 08.12.2018 |

| විදේශ සමුළු හා සම්මන්ත්‍රණ සාරාංශය - 2018 | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | රට | කාල සීමාව |
| 4 | අජිතා බටගොඩ මිය | අධ්‍යක්ෂ | බෝ නොවන රෝග වැළැක්වීම හා පාලනය කිරීමේ තිරසර මූල්‍යකරණය සඳහා හවුල්කාරීත්වය පිළිබඳ සෞඛ්‍ය සංවිධානයේ විශ්වීය සංවාදය | ඩෙන්මාර්කය | 09.04.2018 - 11.04.2018 |
| | | | ආසියාවේ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම පිළිබඳ ටෝකියෝ රාජ්‍ය මූල්‍ය සංසදය | ජපානය | 04.06.2018 - 05.06.2018 |
| 5 | කේ පී ඩී පී කරුණානායක මයා | ගණකාධිකාරී | ශ්‍රී ලංකාව සඳහා නිදහස් වෙළඳ කලාප කළමනාකරණය පිළිබඳ සමුළුව - 2018 | චීනය | 18.04.2018- 08.05.2018 |
| 6 | ජීවන්ති සේනානායක මෙය | අධ්‍යක්ෂ | සංවර්ධිත රටවල් සඳහා බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සමුළුව - 2018 | චීනය | 04.07.2018 - 24.07.2018 |

## 5.2.2 දේශීය පුහුණු

2018 වසරේදී පහත නිලධාරීන්ට විවිධ ක්ෂේත්‍රවල දේශීය පුහුණුව ලබා දෙන ලදී.

### 13 වගුව: දේශීය පුහුණු සාරාංශය 2018

| දේශීය පුහුණු සාරාංශය – 2018 | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | කාල සීමාව | ආයතනය |
| 1 | සියලුම කාර්යය මණ්ඩලය | • අධ්‍යක්ෂ<br>• සහකාර අධ්‍යක්ෂ<br>• සංවර්ධන නිලධාරී<br>• කළමනාකරණ සහකාර<br>• කාර්යාල සහයක<br>• රියදුරු | ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන | 23.02.2018 25.02.2018 | යාපනය |
| 2 | වයි පී සුමනාවතී මිය | අධ්‍යක්ෂ | රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ පුහුණුව | 29.10.2018 - 31.10.2018 | මිලෝදා |
| 3 | ඩබ් ඒ එන් තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ | | | |

| දේශීය පුහුණු සාරාංශය – 2018 | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | කාල සීමාව | ආයතනය |
| 4 | කේ එන් මාලිකා පෙරේරා මිය | කළමනාකරණ සහකාර | මූල්‍ය ප්‍රකාශන සැකසීම | 19.09.2018 -21.09.2018 | මිලෝදා |
| 5 | කේ පී ඩී පී කරුණානායක මයා | ගණකාධිකාරී | රජයේ විගණන ප්‍රමිතීන් හා විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම | 15.01.2018 -18.01.2018 | මිලෝදා |
| 6 | ටී ඩී පී ලියනගේ මිය | අධ්‍යක්ෂ | රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | 2018 සැප්තැම්බර් සිට | මිලෝදා |
| 7 | එස් ඒ එල් සමරසේකර මිය | සහකාර අධ්‍යක්ෂ | | | |
| 8 | ඩබ් ඒ එන් තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ | | | |
| 9 | වයි පී සුමනාවතී මිය | අධ්‍යක්ෂ | රාජ්‍ය අංශයේ ලංසු ඇගයීම | 2018 සැප්තැම්බර් සිට | මිලෝදා |
| 10 | ඩබ් ඒ ඩී ඩී එස් වික්‍රමසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ | | | |
| 11 | කේ පී ඩී පී කරුණානායක මයා | ගණකාධිකාරී | රාජ්‍ය ප්‍රසම්පාදනයේ අභ්‍යන්තර විගණන ක්‍රියාදාමය | 2018 සැප්තැම්බර් සිට | මිලෝදා |
| 12 | ඩබ් ඒ ඩී ඩී එස් වික්‍රමසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ | ලංසු ලේඛණ හා ටෙන්ඩර් ක්‍රමවේද සකස් කිරීම | නොවැම්බර් 19,20,21 | මිලෝදා |
| 13 | ඩබ් ඒ ඩී ඩී එස් වික්‍රමසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ | සමීක්ෂන මණ්ඩල හා හානි හා කපා හැරීම් | නොවැම්බර් 28,29 | මිලෝදා |
| 14 | එන් ආර් ඩබ් එන් කුමාරි මිය | සහකාර අධ්‍යක්ෂ | වෘත්තීයවේදීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 2018 වසර තුල | මිලෝදා |
| 15 | ආර් ඒ ටී ඒ රණවීර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පුරෝකථන අයවැයකරණය හා මූල්‍ය කළමනාකරණය | 05.04.2018 -06.04.2018 | අධ්‍යයන බැංකුකරණ මධ්‍යස්ථානය |
| 16 | වයි පී සුමනාවතී මිය | අධ්‍යක්ෂ | දිපව්‍යාප්ත සේවාවන්හි පන්තියේ නිලධාරීන් සඳහා ජාත්‍යන්තර ටෝස්ට්මාස්ටර් සංගමය සමග කථන පුහුණුව | 2018 වසර තුල | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 17 | ආර් ඒ ටී ඒ රණවීර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | | | |
| 18 | ජේ ජයසුන්දර මයා | අධ්‍යක්ෂ | රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව මූල්‍ය අවධානම් තක්සේරු කිරීමේ ආදර්ශ වැඩමුළුව | 02.10.2018 - 03.10.2018 | රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්ව සඳහා වන ජාතික නියෝජිතායතනය |
| 19 | එම් අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ | | | |

**දේශීය පුහුණු සාරාංශය – 2018**

| | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | කාල සීමාව | ආයතනය |
|---|---|---|---|---|---|
| 20 | එම් අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ | උපාය මාර්ගික දැනුම් විසඳුම් ලබාදීමට සහය වීමේ වැඩමුළුව - ආදාන ප්‍රතිදාන ආර්ථික විශ්ලේෂණය 1 කොටස මූලිකාංග | 07.05.2018 - 11.05.2018 | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 21 | ජීවන්ති සේනානායක මෙය | අධ්‍යක්ෂ | | | |
| 22 | ඩබ් ඒ ඩී ඩී එස් වික්‍රමසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ | | | |
| 23 | කේ පී ඩී පී කරුණානායක මයා | ගණකාධිකාරී | | | |
| 24 | ජේ ජයසුන්දර මයා | අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා රාජ්‍ය නිලධාරීන් සඳහා උපායමාර්ගික ව්‍යාපෘති සූදානම් කිරීමේ වැඩමුළුව | 14.09.2018 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව |
| 25 | නාලනී අමරතුංග මිය | අධ්‍යක්ෂ | | 21.09.2018 | |
| 26 | සමන්ති මීතලාව මිය | අධ්‍යක්ෂ | | 28.09.2018 | |
| 27 | ඒ වී ජනාදර මයා | අධ්‍යක්ෂ | භාණ්ඩාගාර නියෝජිතයින් සඳහා වැඩමුළුව | 20.10.2018 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| 28 | සමන්ති මීතලාව මිය | අධ්‍යක්ෂ | | | |
| 29 | අජිතා බටගොඩ මිය | අධ්‍යක්ෂ | | | |
| 30 | බියංකා එන් ගමගේ මෙය | අධ්‍යක්ෂ | | | |
| 31 | එස් අයි එම් රෝසා මයා | අධ්‍යක්ෂ | | | |
| 32 | ආර් ඒ ටී ඒ රණවීර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | | | |

## 5.3. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන 2018 අයවැය ඇස්තමේන්තුවල 240 ශීර්ෂය යටතේ දක්වේ. අයවැය ප්‍රතිපාදන වැඩසටහන් දෙකක් යටතේ ලබා දී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වැඩසටහන | 01 | - | මෙහෙයුම් කටයුතු |
| | වැඩසටහනේ 01 වන ව්‍යාපෘතිය | 01 | - | අයවැය සැකසීම හා ප්‍රතිපත්ති |
| (ආ) | වැඩසටහන | 02 | - | සංවර්ධන කටයුතු |
| | වැඩසටහනේ 02 වන ව්‍යාපෘතිය | 02 | - | පරිපූරක සහායක සේවා හා අවිනිශ්චිත අවස්ථා වගකීම් |

01 වන ව්‍යාපෘතිය මගින් අයවැය සැකසීම හා ප්‍රතිපත්ති පිළිබඳ දෙපාර්තමේන්තු පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන ලබාදෙන අතර, 02 වන ව්‍යාපෘතිය මගින් විවිධ වියදම් කරන ආයතනවලට අවශ්‍ය වන පෙර නුදුටු හා අනපේක්ෂිත වියදම්, 2018 අයවැය කතාවේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වියදම් හා මුදල් වර්ෂයේ ප්‍රකාශිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සඳහා වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදෙයි.

2018 වර්ෂය සඳහා රු.320,059,877,000 ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ ලබාදෙන ලදී.

### 14 වගුව: ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන උපයෝජනය කිරීම

| | | රු |
|---|---|---|
| (1) | 1 වැඩසටහනේ 01 ව්‍යාපෘතියේ වියදම | 6,244,464,582 |
| (2) | 02 ව්‍යාපෘතියේ 2 වැඩසටහන යටතේ වෙනත් වැය ශීර්ෂයන්ට මාරු කරන ලද ප්‍රතිපාදන | 312,973,327,854 |
| | **එකතුව** | **319,217,792,436** |
| | **ඉතිරි ප්‍රතිපාදන** | **842,084,564** |

## 5.3.1. 2018 වර්ෂය සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

2003.12.31 අංක 114 චක්‍රලේඛයට අනුව, පහත වගුවේ දත්ත මගින් දැක්වෙන්නේ දෙපාර්තමේන්තුව තුළ අත්තිකාරම් ගිණුම් අංක 240-011 යටතේ කළ ගණුදෙනු පමණි. චක්‍රලේඛ අංක 118 අනුව බාහිර හෝ අභ්‍යන්තර මාරුවීම් ලද නිලධාරීන්ගේ ණය ශේෂයන් අත්තිකාරම් ගිණුම් අංක 240-012 ගිණුම් ශීර්ෂ යටතේ නිරවුල් කර ඇත. මෙම ණය ශේෂයන් පියවීම සම්බන්ධව 2018 වසර තුළ වූ වියදම රු. 1,878,292.00 ක් වූ අතර ලැබීම් රු. 3,340,642.04 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ අනුමත සීමාව හා අනුගත වී ඇත.

### 15 වගුව: 2018 වර්ෂය සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

| වර්ගය | 2018 සඳහා අනුමත සීමාව (රු.) | තථ්‍ය ප්‍රමාණය 2018 (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 11,000,000.00 | 9,933,467.38 |
| උපරිම ලැබීම් සීමාව | 5,000,000.00 | 6,305,885.94 |
| උපරිම ණය ශේෂ සීමාව | 35,000,000.00 | 28,544,703.46 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### 16 වගුව: 2018 වර්ෂයේ දී ලබාදුන් ණය


| ණය/අත්තිකාරම් | ලබාදුන් ණය ප්‍රමාණය | මුදල රු. |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 91 | 910,000 |
| විශේෂ අත්තිකාරම් | 43 | 172,000 |
| ආපදා, බයිසිකල් සහ වෙනත් ණය | 136 | 8,851,467.38 |
| **එකතුව** | **270** | **9,933,467.38** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### 5.3.2 2018 වර්ෂය සඳහා විගණකාධිපතිගේ විමසුම්

2018 වසර තුළ මෙම දෙපාර්තමේන්තුව වෙත විගණකාධිපති විසින් විමසුම් දහඅටක් (18) යොමුකර ඇති අතර, ඒ සියළු විමසුම් සඳහා නිසි පරිදි පිළිතුරු ලබාදී ඇත.

## 5.4 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය (අනුමත කාර්යය මණ්ඩලය අනුව)




| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අ.ජ. | - | අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධි | - | ගණකාධිකාරී |
| අ | - | අධ්‍යක්ෂ | නි.අ. | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පරි.නි. | - | පරිපාලන නිලධාරී |
| ස.අ. | - | සහකාර අධ්‍යක්ෂ | කළ.ස. | - | කළමනාකරණ සහකාර | භා.ප. | - | භාෂා පරිවර්තක |
| තො.තා.නි. | - | තොරතුරු තාක්ෂණ නිලධාරී | ස.නි. | - | සංවර්ධන නිලධාරී | කා.කා.ස. | - | කාර්යාල කාර්යය සහයක |